# දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 (MN-1) III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020

** විශේෂයෙන් සැළකිය යුතුයි **

**මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ දී දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ (www.psc.sp.gov.lk) ලියාපදිංචි වී අයදුම් කිරීම අනිවාර්යවේ.**

**මෙම විභාගයේ දී දකුණු පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ට පමණක් පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.**

- වැඩ ක්ෂේත්‍ර පරිපාලක
- සෞඛ්‍ය පරිපාලක
- මැහුම් උපදේශිකා
- ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භාරකරු / මධ්‍යස්ථාන භාරකරු (ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතිය)
- වෙළඳපොළ පරිපාලක
- පරීක්ෂණාගාර සහායක

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :**

(අ). සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ). මැහුම් උපදේශක තනතුර සඳහා මාස 06 කට නොඅඩු මැහුම් පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**පදිංචිය සනාථ කිරීම :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට "**පූර්වාසන්නයේ වසර 05 ක කාලය තුළ අනුගාමී වසර 03 ක අයදුම්කරුගේ ස්ථිර පදිංචිය හෝ පූර්වාසන්න වසර 03 ක කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සමග අයදුම්කරුගේ එක් වසරක ස්ථිර පදිංචිය**" සනාථ කළ යුතුය.

විභාගය සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සියලු උපදෙස් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) මගින් ලබා ගත හැකිය. අන්තර්ජාලය හරහා අනිවාර්යෙන්ම විභාගය සඳහා ලියාපදිංචි විය යුතු අතර, A4 (සෙ.මී. 21X29) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් ලබාගත් අයදුම්පත්‍රයෙහි දෘඪ පිටපතක් (Hard Copy) අපේක්ෂකයින් 2020-12-04 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් පමණක් පහත ලිපිනයට යොමු කළ යුතුය.

**ලේකම්,**
**දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**6 වන මහල,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,**
**ගාල්ල.**

**ගාමිණී වීරවික්‍රම,**
**ලේකම්.**

**වැඩිදුර තොරතුරු සඳහා විමසන්න - 091-2248450**